## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නීති සහකාර තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2025 (2026)

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නීති සහකාර තනතුරු එකක (01) පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන ලද ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුරු නාමය - නීති සහකාර
සේවා ගණය - ආශ්‍රිත නිලධාරි
පුරප්පාඩු ගණන - 01

**02. අධ්‍යාපන සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**03. වැටුප :**

I. වැටුප් කේත අංකය : MN 4 -2025 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව)
II. වැටුප් පරිමාණය : රු. 53,060- 10 x800 -11x 1,190 – 10 x1,320–5 x1,350 - රු. 94,100/=
III. වැටුපට අමතරව රජය අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**04. වයස :**

අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

**05. කායික සුදුසුකම්:**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**06. වෙනත් සුදුසුකම් :**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් **2026.01.23** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**07. බඳවා ගැනීමේ ක්‍රමය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මෙම නිවේදනයේ ඡේද අංක 08 යටතේ සඳහන් ලකුණු දීමේ පරිපාටියට අනුකූලව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ :

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම්* | 20 | අදාළ නොවේ. |
| අතිරේක වෘත්තීය සුදුසුකම්* | 15 | |
| පළපුරුද්ද* | 30 | |
| භාෂා හැකියාව* | 15 | |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම* | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| **එකතුව** | **100** | |

* සුදුසුකම් ලිඛිතව සනාථ කළ යුතුය.

**09. පත්වීමේ ස්වභාවය :**

I. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.

II. තෝරාගත් අපේක්ෂකයින් පත්වීමේ දින සිට තුන් අවුරුදු (03 ) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලැබේ.

III. පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිනු ඇත.

IV. පත්වීම් ලාභීන් විසින් රජය විසින් පත්වීමට අදාළව නියම කරනු ලබන අනෙකුත් අවශ්‍යතාවයන් නිසි පරිදි සම්පූර්ණ කර ගැනීම සිදුකළ යුතු ය.

**10. අයදුම් කිරීමේ ක්‍රමය:**

I. ආදර්ශ අයදුම්පත මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම පිළියෙළ කළ යුතු අතර, එය තමාගේම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. අයදුම් පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වේනොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතු ය.

අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබාගත යුතු ය. (ආදර්ශ අයදුම්පතේ අංක 01 සිට අංක 06 දක්වා පළමු පිටුවේද අංක 07 සිට අංක 8.2 දක්වා දෙවන පිටුවේද අංක 8.3 සිට අංක 11 දක්වා තෙවන පිටුවේද 12 සිට 14 දක්වා සිව්වන පිටුවේද වනසේ A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න.) ආදර්ශ අයදුම් පත්‍රයට අනුකුල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රමාණවත් වනු ඇත.

II. **අයදුම්පත් යොමුකළ යුතු ආකාරය සහ අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය**

**අයදුම්පත් 2026.01.23 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ - 10. යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.** එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ“ නීති සහකාර තනතුරට බඳවා ගැනීම” ලෙස පැහැදිළිව සඳහන් කළ යුතු ය.

III. **දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ගේ අයදුම්පත්**

දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

**IV. අයදුම්පත් සහතික කිරීම**

දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධරයෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන් ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්වයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥයෙකු / නොතාරිස් කෙනෙකු / රජයේ පාසලක විදුහල්පති වරයෙකු/ නාවික/ ගුවන්/ යුධ හමුදාවක කොමිෂන් ලත් නිලධාරියෙකු/ රජයේ ස්ථිර සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු/ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විය යුතුය.

11. **සාවද්‍ය තොරතුරු සැපයීම**:

අයදුම්කරුවන් තම අයදුම්පතේ සඳහන් කර ඇති කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදිබව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙරාතුව හෝ එය පවත්වන අවස්ථාවේ දී හෝ ඉන් පසුව හෝ කවර අවස්ථාවකදී වුවද අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත.

12. මෙම නිවේදනයේ සඳහන් නොකරන ලද අදාළවන්නා වූ වෙනයම් කරුණක් වේ නම් එය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටක දී සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

සුසන්ත කහවත්ත,
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

**2025 දෙසැම්බර් මස 19 දී ය.**
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත.
කොළඹ - 10.